විශේෂයෙන්ම හුවා දක්වා ඇත්තේ 'ආර්ථික ත්‍රස්තවාදය' විසින් 'සන්නද්ධ ත්‍රස්තවාදයෙහි' පිබිදීමක් සිදු වීම සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් මානව හිමිකම් උල්ලංඝනය වී ඇති බවයි. නිහාල් ශ්‍රී අමරසේකර ඉතා ප්‍රබල ලෙස හුවා දක්වන්නේ 'මනුෂ්‍යත්වයේ වැදගත්කම' 'ජාතිකත්වයේ හැඟීම්' වලට ඉහලින් මුදුන්පත් වීමය. දිළිඳුකම තුරන් කිරීම සඳහා ක්‍රියාත්මක වන වැඩපිළිවෙලවල් මගින් සත්‍ය වශයෙන්ම සිදු කෙරෙනුයේ, හුදෙක් දිළිඳුකම වෙනුවෙන් වියදම් කිරීම වෙනුවට, සමාජීය සහ දේශපාලනික බලපෑම් සිදු කරමින් කොල්ල කා සහ මංකොල්ල කා ඇති, එම දිළිඳු මහජනයාගේම වත්කම් වලින් සහ ධනයෙන් සොච්චමක් නැවත ඔවුන්හට ලබා දීමය. දේශපාලඥයින් මැතිවරණ වේදිකා මත දැඩි ලෙස මහ හඬින් උද්ඝෝෂණය කරමින්, වංචා සහ දූෂණයන්ට එරෙහිව ප්‍රබලව හඬ නගමින්, හෙලා දක්වමින්, ඒවාට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගන්නා බවට ප්‍රතිඥා දෙති. කෙසේ වෙතත්, රාජ්‍ය බලය දිනා ගත් පසු, මෙම දේශපාලඥයන් වංචා සහ දූෂණ යටපත් කර එයින් වැජඹෙන්නේය. එසේ කරනු ලබන්නේ විශේෂයෙන් ජාත්‍යන්තර බහු ජාතික සමාගම් වලට යටත් වීමෙන්, ඔවුන්ගේ වංක සංග්‍රහයේ අතකොලුවන්ද, දේශපාලඥයන්ට වියදම් දරන්නන් සහ ඔවුන්ගේ තැරැව්කරුවන්ද සමඟ ඛේදජනක ලෙස වෘත්තිධාරීන්ද හවුල් වී කටයුතු කිරීමත් සමඟිනි. මෙම යථාර්ත තත්වය නිහාල් ශ්‍රී අමරසේකර, ඔහුගේ සැබෑ ජීවන අත්දැකීම් මත, ජීවිතයේ සත්‍ය යථාර්තය මෙම පොත් පෙල තුළින් මනා සේ හෙළිදරව් කර ඇත්තේ, මෙවැනි දුෂ්කර ප්‍රශ්න හා ගැටලු තත්වයන් අනෙකුත් රාජ්‍යයන්හි ජනතාවටද අදාල වන බැවිනි.